**මුලටියන ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ ලැබිය යුතුව තිබූ රු.474,496 ක මුදල ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) කර්මාන්ත 03 ක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල රු.921,647 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) එකතුව රු.1,800,912 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) රු.4,192,341 ක් වූ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

--------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර එකතුව රු.4,767,646 ක අසමානතා පවතින බව නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

------------------

නිරවුල් කිරීමට පියවර නොගෙන 2013 වර්ෂයේ සිට නොවෙනස්ව ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ වූ රු.36,289 ක බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද පියවර ගෙන නොතිබුණි.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,682,612 ක් වූ ටෙන්ඩර් තැන්පතු ශේෂය තුළ, වසර 02 ක කාලයක් ඉක්මවූ රු.962,550 ක ශේෂ ඇතුළත්වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.523,479 ක් වූ කුලී පාලන ගිණුමේ ශේෂය තුළ, වසර 03 ට වැඩි කාලයක් ඉක්මවූ රු.224,900 ක ශේෂ 06 ක් ඇතුළත්වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයට පෙර සිට පැවත එන හිඟහිටි වෙනත් ආදායම් ශේෂය තුළ වූ හඳුනාගත නොහැකි රු.31,248,246 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

එකතුව 29,797,688 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු, වාර්ෂික සමීක්ෂණ වාර්තා සහ උපලේඛන ද, එකතුව රු.1,163,692 ක් වූ විවිධ තැන්පතු සම්බන්ධයෙන් උපලේඛනද, එකතුව රු.31,248,246 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛනය, ශේෂ සනාථ සහ ණයගැති ලේඛනයද, එකතුව රු.3,080,472 ක් වූ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් උපලේඛන, ශේෂ සනාථ හා කාල විශ්ලේෂණ යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.11,255,523ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.13,430,062 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,174,539 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 74 ක් ඉක්ම වූ මුළු පුනරාවර්තන වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) සභාවේ ස්වයං උත්පාදිත ආදායම ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂ දෙකෙහිද සැළකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී තිබූ අතර, ස්වයං උත්පාදිත ආදායම් මගින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිඳු ආකාරයකින් නොහැකි තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------

සමාලෝචිත වර්ෂයේ හිඟහිටි වෙනත් ආදායම් ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අයනොවී පවතින රු.31,248,246 ක ශේෂ පැවතීමෙන් ජංගම හා ක්ෂණික අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

### 2.4 ආදායම් පරිපාලනය

------------------

#### 2.4.1 අක්කර බදු

------------

ආරම්භක හිඟය රු.66,488 ක් වූ අතර, රු.21,687 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.88,175 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.18,916 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.69,259 ක හිඟ ශේෂයක් පැවතුණි.

**2.4.2 බදු කුලී**

ආරම්භක හිඟය රු.483,580 ක් වූ අතර, රු.2,854,085 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.3,337,665 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.2,814,185 ක් වූ නිසා, වර්ෂය අවසානයට රු.523,480 ක් හිඟව පැවතුණි.

**2.4.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,278,770 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.11,555,102 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

සේවක සංඛ්‍යා සැළැස්මේ අනුමත ද්විතියික හා ප්‍රාථමික තනතුරුවල පැවති පුරප්පාඩු 04 පිරවීමට මෙන්ම, 11 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.2 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජන වත්කම්**

පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) රු.850,000 ක් වූ සභාවට අයත් ඉඩම් 02 ක පිහිටි ස්ථාන හඳුනාගෙන නොතිබූ අතර, එකතු වටිනාකම රු.10,792,030 ක් වූ ඉඩම් 09 ක මායිම් ලකුණුකර ආරක්ෂා කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) පිරිවැය රු.7,967,142 ක් වූ යන්ත්‍රයක් 2015 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව විවිධ ප්‍රතිපාදන යටතේ රු.49,450,000 ක් වූ වැඩ යෝජනා 38 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, වර්ෂය තුළ ඉන් කිසිඳු වැඩ යෝජනාවක් ඉටුකර නොතිබුණි.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ රු.1,000,000 ක ප්‍රතිපාදන ලැබී මසක් තුළ අදාළ ව්‍යාපෘති ඉටුකර, ප්‍රගතිය වාර්තා නොකිරීම නිසා සභාවට ලැබිය යුතු රු.3,650,000 ක ප්‍රතිපාදන අහිමිවී තිබුණි.

## 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් වැටුප් හා දීමනා, ඉන්ධන හා වාහන අළුත්වැඩියා වෙනුවෙන් රු.3,603,334 ක වියදම් දරා තිබුණි. ඉන් උපයාගෙන තිබුණු ආදායම රු.69,624 ක් වූ අතර, නොදිරන කසළ සභාව සතු ඉඩමකට බැහැර කර තිබුණද, එම ඉඩම සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

## 3.5 පාරිසරික බලපෑම

2008 ජනවාරි 25 දින අංක 533/16 දරන ගැසට් නිවේදනය පරිදි වර්ෂය තුළ පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබූ ව්‍යාපාර ආයතන 79 කින් රු.269,200 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.7,019,014 ක් වූ ඉතිරි කිරීම්ද, ආදායම් විෂයයන් 03 ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.6,313,740 ක් ද, පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. සභාව විසින් පත් කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී රු.471,178 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) වත්කම් කළමනාකරණය